පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය - 11 වන සතිය

විෂය - ICT

පංතිය - 6ශ්‍රේණිය

සකස් කළේ - M.M.S.B මේගසූරිය

## පරිගණක සංරචක හදුනා ගනිමු

පරිගණකය යනු සංරචක ගණනාවකින් සමන්විත පද්ධතියකි. එම පද්ධතියට ආදාන උපක්‍රම, ප්‍රතිදාන උපක්‍රම, මධ්‍ය සැකසුම් ඒකකය, ප්‍රධාන මතකය, ආචයන උපක්‍රම සහ සන්නිවේදන උපක්‍රම වලින් සමන්විත වේ. එම උපක්‍රම සියල්ල අතින් අල්ලන්න හැකි බැවින් ඒවාට **දෘඩාංග** ලෙස හදුන්වනු ලබයි.

ඉහත උපාංග වලින් සමන්විත පරිගණක පද්ධතිය මගින් යම්කිසි කාර්යයක් සිදුකර ගැනීම සදහා අපට අතින් ඇල්ලිය නොහැකි දෙයක් පරිගණකයට ලබා දිය යුතුයි. එසේ අතින් ඇල්ලිය නොහැකි දත්ත හා උපදෙස් අඩංගු වැඩසටහන් වලට **මෘදුකාංග** ලෙස හදුන්වයි.

ඉහත දෘඩාංග හා මෘදුකාංග උපයෝගී කර භාවිතා කරන පුද්ගලයා **පරිශීලක** නමින් හදුන්වයි.

**පහත සදහන් වාක්‍ය ඉදිරියෙන් ඇති වරහන තුල හරි (✓ ) හෝ වැරදි (× ) ලකුණ යොදන්න.**

(1) යතුරු පුවරුව මෘදුකාංගයක් සදහා උදාහරණයකි. ( )
(2) වින්ඩෝස් (Windows) යනු මෙහෙයුම් පද්ධතියකි. ( )
(3) පරිගණක ක්‍රීඩා මෘදුකාංගයක් නොවේ. ( )
(4) CD තැටිය සන්නිවේදන උපක්‍රමයකි. ( )
(5) ආදාන උපක්‍රමයක් ලෙස ස්කෑනරය සලකයි. ( )
(6) මධ්‍ය සැකසුම් ඒකකය පරිගණක පද්ධති ඒකකය තුල පවති. ( )
(7) පරිගණකය තුල ඇති දත්ත හා තොරතුරු හුවමාරුවට රවුටරය භාවිතා කරයි. ( )
(8) DVD තැටිය අභ්‍යන්තර ආචයන උපාංගයකි. ( )
(9) RAM යනු පරිගණකයේ ප්‍රධාන මතකය ලෙස හදුන්වයි. ( )
(10) දත්ත සකස් කිරීමකට භාජනය කළ පසු තොරතුරු ලබා දෙයි. ( )